**ශීර්ෂය 123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය- 123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මි. 117.15 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු. මි. 74.78 ක් ලෙසත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.මි. 105.91 ක් ලෙසත් දක්වා තිබීමෙන් එකී වටිනාකම් එකිනෙකට නොසැසඳුනි. | රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි කර එහි වත්කම් අමාත්‍යාංශයට පැවරීමේදී, භාණ්ඩාගාර ගිණුම් වලට ගෙන ඇත්තේ ප්‍රධාන අමාත්‍යාංශයේ ආරම්භක ශේෂයන් වශයෙනි. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිතය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම නිසා මෙම වටිනාකම් ගැලපීම් කිරීමේදී සැසඳී නැත. | වර්ෂය තුළ දී පවරා ගන්නා ලද වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |

**(ආ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිරියට ගෙන එමින් පැවති රු.මි. 20 ක නොපියවූ අග්‍රිම හර ශේෂය, මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි, අනුමැතිය ලබාගෙන ජාතික අයවැය ප්‍රතිපාදන සලසා ගෙන මු.රෙ. 109 පරිදි ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල නිරවුල් කර ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවති. | නොපියවූ අග්‍රිම හර ශේෂය, මු.රෙ. 109 පරිදි ලියා හැරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අහෝසි වූ රාජ්‍ය අමාත්‍යාංශවලින් මාරු කරන ලද රු.මි. 1,876 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මෙම අමාත්‍යාංශය වෙත මාරු කිරීමේදී මු.රෙ.751,755 (1) හා (2) ඡේද ප්‍රකාරව, ලෙජරයෙහි දැක්වෙන භාණ්ඩ ශේෂය භෞතිකව පරික්ෂා කර නොතිබූ අතර අමාත්‍යාංශ බඩු ලේඛන පොත්වලටද ඇතුලත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ CIGAS වැඩසටහනේ භාණ්ඩාගරයේ පරිගණකගත වත්කම් කළමණාකරණ දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත. ඉදිරි මාස කිහිපය තුල ලේඛන යාවත්කාලීන කිරීම අවසන් කිරීමට කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රජයේ දේපලවල භාරය වෙනත් පාර්ශවයක් වෙත පැවරීමේදී හා භාරගැනීමේදී ඒවායේ නිවැරදි බව පරික්ෂා කර ලේඛනගත කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්ථන වැය විෂයන් 11 ක එකතුව රු. මි. 2.33 ක ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන වැයවිෂයයන් 20 ක එකතුව රු.මි. 313 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිවී තිබුණු බැවින් මෙම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට අපේක්ෂා කරන ලද, කාර්යයන් ඉටුකර නොතිබුණි. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී සත්‍ය වශයෙන්ම ඇති වේ යැයි අපේක්ෂා කරන පුරෝකථනයන් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කළ යුතු බව. |
| (ආ) | එක් වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. මි. 0.77 ක් ලබාගෙන තිබුණද, එම මුදල අදාල කාර්යය සඳහා වැය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි පුරෝකතනයක් මත කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර ගත් ප්‍රතිපාදන වර්ෂය තුල අදාල කාර්යය සඳහා වැය කළ යුතු බව. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව අමාත්‍යාංශය විසින් වැයවිෂයයන් 06 ක් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන ඉතිරිය වූ රු.මි. 3.43 ක සීමාව ඉක්මවා රු.මි. 396.57 ක බැරකම් වලට එළඹ තිබුණි. | යම් යම් වැය විෂයන් සඳහා වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් වලට ඇතුල් වන අතර එම බැඳීම් එළඹෙන පළමු ගිණුම් වර්ෂය තුළදී ම අදාල කාර්යය ඉටු කරගැනීමෙන් පසු ඊට අදාල බැරකම් නිදහස් කරනු ලබයි. | සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට නොඑළඹිය යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණද ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයේ අක්කර 266 ක් පමණ වූ ප්‍රදේශයක කසල රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකර, එයට බස්නාහිර කලාපය තුල දෛනිකව එකතු වන ඝණ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1200 ක්, දුම්රිය මාර්ග ඔස්සේ බැහැර කිරීමේ ව්‍යාපෘතිය, 2017 අප්‍රේල් 14 දින මීතොටමුල්ල කසල කන්ද නායයෑමෙන් ජීවිත 32ක් අහිමි වීමත් සමග ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර 2017 මැයි 09 දින අනුමැතිය ලබාගෙන තිබුණි. මෙය විදේශීය ආධාර මත සිදු කිරීමට යෝජනා වී තිබුණද ලෝක බැංකු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම මත ලබාදීමට එකගවූ ඇ. ඩො. 700,000 ක ආධාර මුදල අහිමි වී තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදලින් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රු.මි. 19,127 ක් වූ අතර සක්‍යතා අධ්‍යයන කටයුතුවලට රු.මි. 85 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරිමටද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ කසල හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීම, සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම,දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණු නමුත් එම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදී | ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට ප්‍රදේශයේ ජනතාවගෙන් දැඩි විරොධයක් එල්ල වීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාදවීම, 2020/21 වර්ෂවල කොවිඩ් වසංගත තත්වය, ව්‍යාපෘති සැලසුමට අනුව ගංවතුර පිටාර ඇලක් ඉදිකිරීමට නොහැකිවීම නිසා 2021 නොවැම්බර් මස සිදුවූ ගංවතුර තත්වය හේතුවෙන් යන්ත්‍රෝපකරණවලට හානි සිදුවීම, බිල්පත් ගෙවීම් ප්‍රමාදය නිසා කොන්ත්‍රාත් ආයතනය මාස කිහිපයක් ඉදිකිරීම් කටයුතු වලින් ඉවත්වී සිටීම වැනි හේතු මීට බලපා ඇත. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට කඩිනමින් ලබදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කල යුතු බව. |

ගැනීමේ පැකේජය යටතේ, දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මි.8.27 ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර වසර 03 ගතවී තිබුණද අදාල කාර්යයට යොදවා ගත නොහැකි වීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් වෙනත් කාර්යයන් වලට යොදවා තිබුණි. බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො.මි. 0.8ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණු අතර දුම්රිය වැගන් 34 ක් ඇ.ඩො.මි.2.3ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 21 දින ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල ආයතනය විසින් ගිවිසුම ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රිය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂාවසානය වන විටද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. තවද කසල රැඳවුම් මධ්‍යස්ථානය ගංවතුර ආපදා තත්වයනට මුහුණදීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් නොකිරීම නිසා 2021 වර්ෂයේ ඇතිවූ ගංවතුරෙන් යටවී අක්‍රිය තත්වයට පත්ව තිබූ යන්ත්‍රෝපකරණ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද යථා තත්වයට පත්කර නොතිබුණි.

කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 වන විට රු.මි.21,045 ක් වැයකර තිබුණුද සැලසුම් කල කටයුතු සම්පූර්ණ කර නොතිබුණු බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් 9 තුල පිහිටි නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, ඉදිකර 2021දෙසැම්බර් 15 දින වැඩ අවසන් කරන ලද, මුළු කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 196.2 ක් වූ කඩකාමර 43 ක් සහිත කටුබැද්ද වෙළෙඳපොල ගොඩනැගිල්ලේ, කඩකාමර 18 ක්ද රු.මිලියන 5.6 ක් වැය කර සවිකර තිබුණු විදුලි සෝපානය සහ නල පද්ධතිය අවහිරවූ එක් වැසිකිලියක්ද ව්‍යාපෘති කටයුතු නිමකල 2021 | මුලු කඩකාමර ප්‍රමාණයම දැනට භාවිතයට ගනිමින් පවතී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවා ඉංජිනේරු විසින් මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය ඉදිරියට නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වීමට අවශ්‍ය සහය ලබාදීමට එකඟ වී ඇත. | ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අපේකෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ක්‍රියා කිරීම එයට වගකිව යුතු නිලධාරින්ගේ කාර්යය වන බව. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 15 දින සිටම නිෂ්කාර්යයව පැවතුණු බව 2023 පෙබරවාරි 20 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) | වතු අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හරිත රන් නිවාස වැඩසටහන යටතේ ඉදිකර අවසන් අදියරේ පැවති නිවාස 466 ක් සම්පූර්ණ කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 65 ක් ප්‍රතිපාදනය කර තිබුනද සම්පූර්ණයෙන් නිමකර තිබුණේ, අපේක්ෂිත නිමවුමෙන් සියයට 60 ක් වූ නිවාස 282 ක් පමණක් බව නිරීක්ෂණය විය.<br>2021 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2021 නොවැම්බර් මස වැඩකටයුතු අවසන් කල යුතුව පැවති හැටන්, නුවරඑළිය, මහනුවර, රත්නපුර, කෑගල්ල හා ගාල්ල යන කලාප 06 හි නිවාස ඉදිකිරීම් සඳහා වෙන්කරන ලද රු.මි.451 ක් වූ මුදලින් රු.මි. 227 ක් එනම් සියයට 50 ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | එකඟ වෙමි. | ව්‍යාපෘති යථාර්ථවාදී ලෙස සැලසුම් කල යුතු බව සහ ඉලක්කගත කාලය තුළ නිම කිරීමට ක්‍රියාමාර්ග ගැනීම කළමණාකරණයේ වගකීම බව |
| (ඇ) | වතු අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ වතුකරයේ පවුල් 1,000 ක ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා රු.මි. 2.5 ක් ප්‍රතිපාදනය කර තිබුනද 2022 දෙසැම්බර් 31 දිනට පවුල් 300 කගේ පමණක් ඉඩම් අයිතිය තහවුරු කිරීමට කටයුතු කර තිබුණි. එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 30 ක් පමණක් බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |
| (ඉ) | වතු අංශය යටතේ ක්‍රියාත්මක කල, ඉන්දියානු ආධාර නිවාස 4,000 වැඩසටහන යටතේ, නිවාස 180 ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් රු.මිලියන 95 ක් ප්‍රතිපාදනය කර තිබුනද 2022 දෙසැම්බර් 31 දිනට එයින් රු. මිලියන 35 ක් වැයකර නිවාස 26 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 37ක් සහ සියයට 14 ක් විය. | අමුද්‍රව්‍ය මිල ඉහල යාම ඉන්ධන හිගය ආදී හේතු නිසා ඉදිකිරීම් වැඩ අඩාල විය. මේ වන විට නිවාස 154 ක් පමණක් ඉදිකිරීම් ආරම්භ කර ඇත. | සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සියක් නගර ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 496 ක් වැයකර 2022 ජූනි 30 දින වන විට වැඩ අවසන් කළ, නගර අලංකරණ ව්‍යාපෘති 04ක්, මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 02ක් ඇතුළු ව්‍යාපෘති 15 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල ආයතන වෙත භාරදීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති 11 ක් මේ වනවිට භාරදී ඇත. සභාධිපත්‍ය සැලසුම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ එකඟතාවය නොලැබීම, ඉඩමේ හිමිකම පිලිබඳ ගැටළු පැවතීම ආදී ගැටළු පැවතීම නිසා අනෙක් ව්‍යාපෘති භාරදීමට නොහැකි වී ඇත. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ව්‍යාපෘති නිමකළ වහාම අදාල ආයතන වෙත භාරදීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බුලත්සිංහල ඇගල්ඔය බහු මාදිලි ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත 2016 අගෝස්තු 16 දින රු. මි.41 ක කොන්ත්‍රාත් වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව අදියර 03කට කොටස්කර කොන්ත්‍රාත් වටිනාකම රු.මි. 153 ක් දක්වා සියයට 272 කින් වැඩිකර තිබුණි. තවද ශ්‍රවණාගාරය සඳහා ආසන සවිකිරීම, වායුසමනය කිරීම, ආලෝකකරණය, විදුලි සෝපානය, වේදිකා තිර දැමීම ආදී වැඩකොටස් ආවරණය නොකර ගොඩනැගිල්ලේ භුක්තිය බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත 2018 ඔක්තෝබර් 20 දින භාර දී තිබුණු නමුත් ගොඩනැගිල්ලේ අසම්පූර්ණභාවය හේතුවෙන් ප්‍රයෝජනයකට ගත නොහැකිව පැවතුණි. කෙසේ වුවද 2021 නොවැම්බර් 16 දින වෘත්තීය | 2021 නොවැම්බර් 16 දින සිට වසර 30 ක කාලයක් සඳහා පාඨමාලා පැවැත්වීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත අවබෝධතා ගිවිසුමක් යටතේ ලබා දී ඇත. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන ඉදිකිරීම් සැලසුම් කල යුතු වන අතර, ඉදිකරන ලද ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකි පරිදි සම්පූර්ණ කර අදාල අංශ වෙත පැවරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | පුහුණු අධිකාරිය වෙත අවබෝධතා ගිවිසුමකින් ගොඩනැගිල්ල පවරා දී තිබුණි. මේ අනුව ගොඩනැගිල්ල ඉදිකර වසර 04 ක් පමණ ගතවී තිබුණද එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අපේක්ෂිත කාර්යයන්ට යොදා ගෙන නොතිබුණු බව 2023 මාර්තු 03 දින සිදු කරන ලද ස්ථානීය විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) | වතු ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කර ණය අයකර ගැනීමේ සියළුම කටයුතු ගිවිසුම් ප්‍රකාරව ඉටු කිරීමේ වගකීම වැවිලි මානව සංවර්ධන භාරය වෙත භාර දී තිබුණි. අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අදාල නිවාස ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 7 ක කළමණාකරණ ගාස්තුවක් ගෙවීමටද තීරණය වී තිබුණි. ඒ අනුව 2016 සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර වැඩ අවසන් කර යතුරු භාරදී තිබූ හා නොතිබූ ඇස්තමේන්තුගත වටිනාකම පිළිවෙලින් රු.මිලියන 2,920ක් හා රු.මිලියන 946 ක් වූ නිවාස 4,202 ක් වෙනුවෙන් ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 7 ක ගාස්තුව වූ රු.මි. 270 ක් එම ආයතනය වෙත ගෙවා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රතිලාභින්ගෙන් අයකර ගත යුතු ණය වාරික රු.මිලියන 1,997 ක් අය කර ගෙන නොතිබුණි. | නිවාස ඉදිකිරීම් සඳහා පෙර ඇති කර ගන්නා ලද ගිවිසුම් අනෝන්‍ය අවබෝධයෙන් යුතුව අවසන්කොට 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයීය නිවාස වැඩසටහන වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මිලියන 500 තුළ ඉදිකිරීම් අවසන් කළ හැකි නිවාසවල වැඩ අවසන් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.<br><br>2017 වර්ෂයේ ඉදි කරන ලද නිවාස ව්‍යාපෘතිවල ණය වාරික ගෙවීම ආරම්භ කර ඇති අතර, මේ වන විට 2022 ඔක්තෝම්බර් මස ණය වාරිකය වශයෙන් රු. 62,400 ක මුදලක් අය කර ගෙන ඇත. | වතු ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගතයුතු බව. |

| | | |
|---|---|---|
| තවද 2020 හා 2021 වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ, නිවාස ව්‍යාපෘති 12 ක් හා 30 ක් සඳහා නිවාස 145 ක් හා 602 ක් ඉදිකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.මි. 201ක් හා රු.මි. 837ක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ථ පිරිවැය ලෙස පිළිවෙලින් රු. මි. 110 ක් හා රු.මි. 228 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබූ අතර ඒ සඳහා එම ආයතනය වෙත කළමණාකරණ ගාස්තුද ගෙවා තිබුණි. එසේ වුවද අදාල ව්‍යාපෘතිවල ගිවිසුම්ගත කාලයන්ද ඉක්ම ගොස් තිබුණද ව්‍යාපෘති සම්පූර්ණ කර නිවාස ලාභීන්ට භාරදී අදාල ණය වාරික අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | නිවාස ඉදිකිරීම් සඳහා පෙර ඇති කර ගන්නා ලද ගිවිසුම් අනෝන්‍ය අවබෝධයෙන් යුතුව අවසන්කොට 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයීය නිවාස වැඩසටහන වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මිලියන 500 තුළ ඉදිකිරීම් අවසන් කළ හැකි නිවාසවල වැඩ අවසන් කිරීමේ කටයුතු සිදු කරමින් පවති. | වතු ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගතයුතු බව. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.මි. 563 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2018 ඔක්තෝබර් 26 දින ප්‍රදානය කර තිබුණු පිටිපන තලගල මාර්ගය අදියර 1 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩකටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2019 මාර්තු 06 සහ 2020 නොවැම්බර් 27 දින එකතුව රු.මි.114 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) ඡේදය ප්‍රකාරව ව්‍යෘපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කළහැකී බවට කරුණු සනාථ කර | ඉඩම් හිමිකරුවන් විසින් එකී ඉඩම් වලට ඇතුලත් වී සංවර්ධන කටයුතු සිදු කිරීමට විරෝධතාවය එල්ල කිරීම හේතුවෙන්, රජයේ ඉඩම් පනතේ 14(2) බී වගන්තිය යටතේ ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 49528 හා 49529 යටතේ නඩු පවරා ඇත. | ප්‍රමුඛ අවශ්‍යතාවයන් මත ව්‍යාපෘති හඳුනා ගැනීම හා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නීත්‍යානුකූල ලෙස කටයුතු කිරීම හා ඉලක්කගත කාලයන් තුළ ව්‍යාපෘති නිමකර අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබාදීම අමාත්‍යාංශයේ වගකීම වන බව. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමෙන් තොරව අදාල කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු බැවින් ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී, ඉඩම් අත්පත්කර ගැනීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගෙන් විරෝධතා මතු වී තිබුණි. එම විරෝධතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණු බැවින් ආවස්ථික පිරිවැයක් සහිතව අරමුදල් භාවිතා කරමින් ඉදිකිරීමට නියමිත මාර්ග ඉදිකර අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට නොහැකි වී පැවතුණි. | | |
| (ආ) | අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ ආරම්භ කරන ලද රු.මිලියන 113.93 ක් වටිනා ව්‍යාපෘති 7 ක් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛය පරිදි නවතා දමා තිබුණි. මෙහි ඇතැම් ව්‍යාපෘති සඳහා සියයට 25 සිට සියයට 53 දක්වා පරාසයක වියදම් දරා තිබුණු අතර එම ව්‍යාපෘති අත්හිටවුවහොත් ඒ සඳහා දරන ලද රු. මිලියන 48.62 ක මුදල අනාර්ථික වියදමක් වන බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති 05ක් ඉදිරියට කරගෙන යාම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇත. එම ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු මේ වන විටත් ඉදිරියට කරගෙන යමින් පවතී. | ආර්ථිකමය වශයෙන් ඵලදායිත්වයක් ලබා ගැනීම සඳහා වැඩි නිමවුම් ප්‍රතිශතයක් සහිත ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය අනුමැතිය පරිදි කටයුතු කළ යුතු බව. |
| (ඇ) | වතු අංශයේ විශේෂ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කල රු.මි. 4 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත තලවකැලේ සාම්ප්‍රදායික අවන්හල් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියද, රු.මිලියන 9 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත, 2020 අප්‍රේල් 12 දින ආරම්භ කර තිබූ වටගොඩ ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන මගින් සිදු කරන කුකුළු හා එළු පාලනය, බිම්මල් වගාව හා පොලිතින් ආශ්‍රිත වගා ව්‍යාපෘතීන්ද වෙනුවෙන් පිලිවෙලින් රු.මි. 1.5 ක් හා රු.මි. 1.8 ක් ගෙවා | සාම්ප්‍රදායික අවන්හල් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පිලිබඳ තොරතුරු විමසා ප්‍රධාන විධායක නිලධාරි - සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම වෙත 2023 මැයි 26 දින ලිපි යොමු කර ඇත. | අතහැර දැමූ ව්‍යාපෘති සක්‍රිය කරවා අදාල ප්‍රතිලාභ ලබාදීමට හෝ ගෙවන ලද මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘති අතහැර දමා තිබුණු අතර ගෙවන ලද මුදල් නිශ්කාර්ය වී තිබුණි. මෙම ව්‍යාපෘති අතහැර දැමීමට හේතුද විගණනයට ඉදිරිපත් නොවීය. | | |
| (ඇ) | අමාත්‍යාංශයේ නිවාස අංශය විසින් 2017 - 2020 කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 4,989 ක් වූ නිවාස ව්‍යාපෘති 10ක් යටතේ නිවාස 27,555 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.මි. 4,025 ක් වැය කර තිබුණු අතර ඉන් නිවාස 5,604 ක පමණක් වැඩ නිමකර තිබුණි. ප්‍රගති වාර්තා අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 ට අඩු නිවාස ව්‍යාපෘති 07ක් ද සියයට 25ත් 50ත් අතර වූ ව්‍යාපෘති 02 ක් ද සියයට 75 ට වැඩි ව්‍යාපෘති එකක් ද වී තිබුණි. මෙම ව්‍යාපෘති යටතේ ඉදිකළ යුතු අනෙකුත් නිවාස වල ඉතිරි වැඩ සම්පූර්ණ නොකොට අතරමග නවතා දමා තිබුණි. | 2020 වර්ෂයේ සිට එහි අවිච්ඡේද ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන, අක්මුදල් නොලැබීම හා ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා නිවාස ඉදි කිරීමේ පිරිවැය වැඩි වී ඇත. ඒ අනුව නිවාස ඒකකයක් සඳහා ලබාදෙනු ලබන මුදල නිවසේ සම්පූර්ණ වැඩ අවසන් කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. ඒ අනුව අතිරේක මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවල අත්‍යවශ්‍යතාවය අනුව අරමුදල් සපයාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු බව. |

### 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ වතු අංශය යටතේ, හැටන් හා නුවරඑළිය කලාප 02 හි වතු 06 ක නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ රු.මි. 160 ක ඇස්තමේන්තු ගත මුදලින් රු.මි. 31 ක් එනම් සියයට 19 ක් වැය කර තිබුණද කිසිදු භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයීය නිවාස වැඩසටහන වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මිලියන 500 තුළ ඉදිකිරීම් අවසන් කළ හැකි නිවාසවල වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවල අත්‍යවශ්‍යතාවය අනුව අරමුදල් සපයාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් 2019 වර්ෂයේ ආරම්භ කරන ලද "වැලිඔය නිවාස" යෝජනා ක්‍රමය සඳහා රු.මි. 32 ක් වැයකර ඉදිකිරීමට ඉලක්කගත නිවාස 256 කින් කිසිදු නිවාසයක වැඩ සම්පූර්ණයෙන් නිමකර නොතිබුණි.<br><br>තවද, 2019 වසරේදී ආරම්භ කරන ලද මුලතිව්, කිළිනොච්චි නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මි. 530 ක් වැය කර තිබුණද කිසිදු නිවසක වැඩිදියුණු කිරීම් සම්පූර්ණයෙන් අවසන්කර නොතිබුණි. | 2019 වසරින් පසු මහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන ලැබී නොමැත. ඇස්තමේන්තුවේ ඉතිරි මුදල 2023 වර්ෂයේ ගෙවීම් කිරීමටත් භූමියේ වැඩ 2023 ජූලි මස ආරම්භ කිරීමටත් සැලසුම් කර ඇත. | ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවල අත්‍යවශ්‍යතාවය අනුව අරමුදල් සපයාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු බව. |
| (ඇ) | උතුරු හා නැගෙනහිර පළාත්වල වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශවල ජනතාව සඳහා ජල පිරිපහදු ඒකක 115 ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් රු.මි. 481 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවක් ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව හරහා 2021 ඔක්තෝම්බර් 06 දින පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි.<br>කොන්ත්‍රාත්තුවේ මූලික අදියර යටතේ පිරිපහදු පද්ධතීන් 50 ක් ස්ථාපිත කිරීමට නියමිත වූ අතර එම ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 209 ක් විය. එයින් රු. මිලියන 111 ක්, කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරු වෙත 2021 හා 2022 වර්ෂවලදී ප්‍රජා ජල සම්පාදන දෙපාර්තුමේන්තුව හරහා ගෙවා තිබුණද එකදු ජල පවිත්‍රකරණ පද්ධතියක් හෝ | ව්‍යාපෘතියේ ප්‍රගතිය පදනම් කර ගනිමින් ජල පිරිපහදු ඒකක 25 ක් ඉදිරි දින කිහිපය තුලදී ජනතා අයිතිය වෙත පැවරීමට කටයුතු සූදානම් කරමින් පවතී. | ව්‍යාපෘති වෙනුවෙන් මුදල් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබියදීත් විශේෂ අවධානය යොමුකල යුතු ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වහාම ක්‍රියාත්මක කරවීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කල යුතු බව . |

| | | | |
|---|---|---|---|
| | 2022 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාකාරී තත්ත්වයකට පත්කර වකුගඩු රෝගීන්ට ජලය ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් උතුරු නැගෙනහිර පළාත්වල පවුල් සඳහා කොන්ක්‍රීට් පැනල් නිවාස ඒකක 300 ක් ඉදිකිරීම සඳහා වෙන්කල රු. මි. 384 කින් 2022 දෙසැම්බර් 31 වන විට රු. මි. 106 ක් කොන්ත්‍රාත් ආයතනය වෙත ද රු.මි. 3 ක් උපදේශක ආයතනය වෙතද ගෙවා තිබුණි. ගෙවූ මුදල මුළු පිරිවැයෙන් සියයට 28 ක් වුවද භෞතික ප්‍රගතිය සියයට 4ක් පමණක් විය. එනම් සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව 12 ක් පමණක් වී තිබුණි. ඉදිකල නිවාස 12 සම්බන්ධයෙන්ද තාක්ෂණික උපදේශන ආයතනය විසින් 2022 ජනවාරි 12 ලබා දී තිබූ අවසාන ඇගයීම් වාර්තාවේ සඳහන් පිරිවිතරයන්ගෙන් බැහැරවීම් හා දෝෂ නිවැරදි කරගැනීමට කටයුතු නොකොට එකඟවූ සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. තවද ගිවිසුමෙහි වගන්ති කඩවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කලද මු.රෙ. 507 ප්‍රකාරව අසාධු ලේඛනයට නම ඇතුලත් කිරීමට අවශ්‍ය මූලික පියවරයන් ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කාර සමාගමට ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යාමට නොහැකි බැව් තීරණය කර 2023 පෙබරවාරි 22 දින කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. ඒ අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලින් රජයට අය විය යුතුව තිබූ රු. මිලියන 68.93 ක මුදල හා කාර්ය සාධන ඇපකරය වන රු.මිලියන 19.2 ක මුදල, මුදල් කර ගැනීමට කටයුතු කර ඇත. | ඉදිකිරීම් ප්‍රගතිය අනුව මුදල් මුදාහැරීම සිදුකල යුතු බව. |

## 3.5 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)** | | |
| කොළඹ ජල ද්‍රෝනියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම, කොළඹ නගරය අලංකාර කිරීම අරමුණු කරගෙන කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2017 ජූනි 30 දින අවසන් කිරීමට යෝජිතව 2012 ජූලි 10 දින ආරම්භ කර තිබුණු අතර 2022 ජූනි 30 දින දක්වා අවස්ථා කිහිපයකදී දින දීර්ඝ කර තිබුණි . ව්‍යාපෘතිය සඳහා ණය දෙන නියෝජිතායතනය විසින් ලබා දීමට නියමිත වූ ඇ.ඩො. මි. 213 ට සමාන රු.මි. 27,890 ක මුළු මුදලින් සියයට 93 ක් එනම් ඇ.ඩො. මි. 198 ක් එනම් රු. මි. 33,392 ක් සහ රජයේ ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදිත ඇ.ඩො.මි.108 කට සමාන රු. මි. 14,141 ක් වූ මුළු ප්‍රතිපාදනවලින් සියයට 49 ක් නියෝජනය කරන ඇ.ඩො.මි.69 කට සමාන රු.මි. 8,368 ක් පමණක් 2022 ජූනි 30 දින වන විට උපයෝජනය කර තිබුණි . | එකග වේ. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කල යුතු බව. |
| මෙම ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 353 ක් වූ නොරිස් කැනැල් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතියට එරෙහිව ඒ අවට පදිංචි මහල් නිවාස ඒකකවල නිවැසියන් විසින් නීතිමය | නොරිස් ඇල සංවර්ධනය සඳහා වූ කොන්ත්‍රාත්තුව 2022 අගභාගයේදී දෙපාර්ශවයේම එකගතාවය මත අවසන් කර ඇත. මෙම ගොඩනැගිල්ල ඉවත් කිරීමට හැකිවූ විගස | ව්‍යාපෘතියෙන් අරමුණු කරන ලද කාර්යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාමාර්ග ගෙන තිබීම හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ව්‍යාපෘතිය ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය මගින් කොළඹ මහනගර සභාව හරහා මෙහි ඉතිරි ඉදිකිරීමේ කටයුතු කිරීමට දෙපාර්ශවය එකගතාවයකට පත්වී ඇත. | |
| ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් නාරාහේන්පිට කිරි මණ්ඩල මාවතේ පිහිටි ගොඩනැගිල්ලේ, කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් **(IFMS)** ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 77.4 ක් වැය කර තත්‍ය කාලීන පාලන පද්ධති මධ්‍යස්ථානය **(RTC)** ස්ථාපිත කර තිබුණද**,** අධීක්ෂණ පාලන සහ දත්ත රැස් කිරීමේ පද්ධතිය **(SCADA)** සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර නොතිබුණි | 2023 වසරේදී ඒ් සඳහා අනුමත වූ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරමින් පවතී. | අධීක්ෂණ පාලන සහ දත්ත රැස් කිරීමේ පද්ධතිය ස්ථාපිතකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන** (SCDP)

| | | |
|---|---|---|
| **2014** මැයි **05** දින ආරම්භ කර **2019** දෙසැම්බර් **31** දින එනම් වර්ෂ **5 ½** කින් පමණ අවසන් කිරීමට යෝජිතවූ උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය **2022** ජූනි 30 දින අවසන් කර තිබුනු අතර ආරම්භ කල දින සිට වර්ෂ 8 ½ ක කාලසීමාව තුල ණය නියෝජිතායතනය විසින් ලබාදීමට එකග වූ ඇ.ඩො.මි.202 කට සමාන රු.මි. 27,507 ක් වූ මුළු අරමුදලින් සියයට 45 ක් එනම් ඇ. ඩො. මි.90 කට සමාන රු.මි. 16,437 ක් පමණක් භාවිතා කර තිබුණි. | එකග වේ. පවතින තත්ත්වයන් අරමුදල් භාවිතය අඩුවීමට හේතු වී ඇත. | ව්‍යාපෘතියෙන් අරමුණු කරන ලද කාර්යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| මෙම ව්‍යාපෘතිය යටතේ ගාල්ල නගරයේ ගංවරතුර පාලනය සඳහා හදුනාගත් ගංවතුර පාලන කාණු | ගාලු නගරයේ ගංවතුර තත්වය පාලනය කිරීමට අවශ්‍ය කටයුතු හදුනා | ශක්‍යතා අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති හඳුනා ගැනීම මඟින් මෙම අනාර්ථික උපදේශක |

| | | | |
|---|---|---|---|
| | පද්ධති 16ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා නොගැනීම නිසා ඉදිකිරීම් කටයුතු කල නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ උපදේශන සේවා වෙනුවෙන් රු. මි 21.49 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘතිය අතරමග නතර කිරීම හේතුවෙන් මෙම වියදම් නිශ්කාර්ය වී තිබුණි. | ගැනීමත්,ඒ් අනුව ඇළ මාර්ග දියුණු කිරීම සහ වතුර ඒක්රැස් වන ස්ථාන සංරක්ෂණය කිරීමත් සඳහා මෙම උපදේශන සේවාව ලබා ගෙන ඇත. මෙමගින් හඳුනාගත් ඇළ මාර්ග කිහිපයක් පමණක් වැඩිදියුණු කරන ලදී. | ගාස්තු අවම කර ගත හැකි වන බව. |
| | තවද ව්‍යාපෘතිය යටතේ ගාල්ල මොරගොඩ ප්‍රධාන ඇල සහ පන්සල් අතුරු මාර්ගය ඉදිකිරීම සඳහා එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 845 ක් වූ අතර ඇල මර්ගයේ මුලු දිග මීටර් 4250 ක් විය. එහෙත් රු. මිලියන 397 ක් වැය කර මීටර් 1850 ක් පමණක් නිම කර ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් එහි සම්පූර්ණ ප්‍රතිලාභ ජනතාවට අත්කර දීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම්වලට අවශ්‍ය ඉඩම් පවරා ගැනීමට නොහැකිවීම මෙම තත්ත්වයට හේතු වී තිබුණු බව නිරික්ෂණය විය. | මුල්ම කොන්ත්‍රාත්තුව අවසන් කර නැවත වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කිරීම නිසා පසුව ඇති වූ තාක්ෂණික සහ භූගෝලීය අපහසුතා හේතුවෙන් ඇළ මාර්ගය සම්පූර්ණ කිරීමට කාලය ප්‍රමාණවත් නොවීය. | ශක්‍යතා අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති හඳුනා ගැනීම මඟින් මෙම අනාර්ථික වියදම් අවමකර ගත හැකි වන බව. |
| | උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහනේ එක් සංරචකයක් වන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය ( **Kandy Multimodal Transport Terminal - KMTT)** කාලීනව ආරම්භ නොකිරීම හේතුවෙන් ඒ සඳහා වෙන්කල ඩොලර් මිලියන 92 ක ණය ප්‍රමාණය ලබාදීම, ණය නියෝජිත ආයතනය විසින් අවලංගු කිරීම නිසා ව්‍යාපෘතිය අතරමග නතර වී තිබුණි. | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය කාලීනව ආරම්භ කිරීමට නොහැකි වූයේ එම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදනය කර තෝරාගත් සැලසුම් උපදේශක ආයතනයේ අකාර්යක්ෂම කාර්යසාධනයත්**,** එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් සහ අනෙකුත් ප්‍රදේශ අත්පත් කර ගැනීමේදී සැලකිය යුතු කාලයක් ගත වීමත්ය. | කාර්යක්ෂම කොන්ත්‍රාත් සහ උපදේශන ආයතන තෝරාගෙන ඵලදායක ලෙස ව්‍යාපෘතිය නිම කිරීම කළමනාකරණයේ වගකීම වන බව. |
| **(ඇ)** | **නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය (**SCURP) | | |
| | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය සඳහා ණය ලබාදෙන ආයතනය විසින් එකඟ වූ ඇ.ඩො. මි. **200** ක ණය මුදලෙන්**,** ව්‍යාපෘතිය ආරම්භ වී | **2022 /2021** වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්වය සහ 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය මීට හේතුවිය. | ආදාල කාලසීමාව තුල අරමුණු කරන ලද කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වසර 3 යි මාස **6** කට පසු **2022** දෙසැම්බර් **31** වන විට ව්‍යාපෘතිය සඳහා භාවිත කර තිබුණේ ඇ.ඩො. මි. 40 කට සමාන රු.මි.10,054 ක් පමණි. | | |
| ව්‍යාපෘතියේ අරමුදල් භාවිතයේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් ඇ.ඩො. මි. 200 ක ණය මුදලින් ඇ.ඩො. මි. 70කින් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. මේ අනුව 3 වැනි අදියරේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හිටුවා තිබූ අතර නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාවද 1,272 කින් අඩු කර තිබුණි. තවද ඇ.ඩො.මි. 42 ක් වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය ඇ. ඩො.මි. 28 දක්වා ඇ. ඩො.මි. 14 කින් අඩු කර තිබුණි. සංශෝධිත ගිවිසුමට අනුව ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා පුද්ගලික හවුල්කාර දායකත්වය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණි. | අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය සැපයුම් සපයා ගැනීම සඳහා SCURP වෙතින් ඇ.ඩො.මි. 70 ක් ආපසු යැවීමට තීරණය කර ඇත.<br><br>ණය ගිවිසුම් සංශෝධනය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් එකඟ වූ 2022 ජූලි 1 දිනැති ප්‍රතිව්‍යුහගත ණය ගිවිසුමට අනුව සිදුකර ඇත. | කාර්යක්ෂම අරමුදල් කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු බව සහ ව්‍යාපෘති මූලායන මූලාශ්‍ර සොයා ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 624 ක් ඉදිකිරීම සඳහා වූ කොළඹගේ මාවත නිවාස ව්‍යාපෘතිය 2020 ජූනි 01 දින ආරම්භ කර 2023 අගෝස්තු 24 දින නිමකිරීම සඳහා රු.මි. 3,596 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මි. 1,793 ක් වැය කර සියයට 74 ක භෞතික කාර්යසාධනයක් ලබාගැනීමට සැලසුම් කලද රු.මි. 1,902 ක් එනම් රු.මි. 108.95 ක් වැඩිපුර වැයකර තිබුණද ඉටුකර ගෙන තිබුණේ සියයට 52 ක භෞතික කාර්යසාධනයක් පමණක් බව නිරීක්ෂණය විය. | ගෝලීය වශයෙන් බලපෑමට ලක් වූ කොරෝනා 19 වසංගතය සහ සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියට දැඩි ලෙස බලපෑවේය. | කොන්ත්‍රාත්තුව යටතේ ඉදිකිරීම් ගිවිසුම්ගත පරිදි සිදුකර ගැනීම සඳහා එහි කටයුතු සමීපව අධීක්ෂණය කල යුතු බව. |

| | | |
|---|---|---|
| තවද, ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1,982 ක් වූ නිවාස ඒකක 300 ක් ඉදිකිරීම සඳහා වූ ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතියේ කටයුතු 2020 මැයි 5 වන දින ආරම්භ කර තිබුණි. 2022 ඔක්තෝම්බර් 21 දින ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතව තිබුණද කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 මාර්තු 29 වන දින මෙම ව්‍යාපෘතිය අවසන් කර තිබුණු අතර ඒ් වන විට රු.මි.271 ක් වැයකර සියයට 14ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. එහෙත් 2023 ජූලි මාසය දක්වා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ව්‍යාපෘතිය සහ රේඛීය අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | කාල රාමුව තුළ නිම කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතු බව. |
| එසේම නිවාස ඒකක 700ක් ඉදිකිරීම සඳහා වූ ඇපල්වත්ත නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු.මි. 4,473 ක වටිනාකමට චීන සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු 2020 ඔක්තෝබර් 27 වන දින ආරම්භ කර 2023 ඔක්තෝබර් 17 වන දින අවසන් කිරීමට යෝජිතව තිබුණි. 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම අනුව, මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 64 ක් අපේක්ෂා කලද රු.මි.1,145ක් වැයකර ලබාගෙන තිබුණේ සියයට 22 ක භෞතික කාර්යසාධනයක් පමණක් බව නිරීක්ෂණය විය. | කොරෝනා 19 වසංගතය හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර පසුගිය වසර කිහිපය තුළ අත්විඳින ලද ආර්ථික අර්බුදයද ව්‍යාපෘතිය අවසන් කිරීමට හේතු විය. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| මෙම ව්‍යාපෘතිය යටතේ රු.මි. 4,511 ක ඇස්තමේන්තුගත වටිනාකමකට නිවාස 750ක් ඉදිකිරීමේ ෆර්ගියුෂන් මාවත නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු චීන සමාගමට ප්‍රදානය | කොරෝනා 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනයට දැඩි බලපෑම් ඇති විය. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු බව . |

| | | |
|---|---|---|
| කර තිබුණු අතර කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි 20 දින ආරම්භ කර 2024 ජනවාරි 04 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවලින් සියයට 76 ක් නිමකිරීමට සැලසුම් කලද රු. මි. 595 ක් වැයකර ලගා කරගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 7 ක් පමණක් විය. | | |
| තවද නිවාස ඒකක 700ක් ඉදිකිරීමේ මාදම්පිටිය නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු, රු.මි. 4,529 ක ඇස්තමේන්තුගත වටිනාකමට 2020 මැයි 24 දින ආරම්භ කර 2024 මැයි 03 දින නිම කිරීමටද අපේක්ෂිතය. 2022 දෙසැම්බර් 31 වන විට සියයට 33ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණද රු.මි. 1,164 ක් වැයකර ලබා ගෙන තිබුනු ප්‍රගතිය සියයට 15 ක් පමණක් බව නිරීක්ෂණය විය. | කොරෝනා 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනයට දැඩි බලපෑම් ඇති විය. එබැවින් කාලය දීර්ඝ කිරීම (EOT) අපේක්ෂා කෙරේ. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ 2 වන සංරචකය යටතේ ඉඩම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් 11 ක් යටතේ 2022 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය යටතේ ඉඩම් අක්කර 111.5 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතව තිබුණද අක්කර 4 ක ඉඩම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පමණක් සිදුකර තිබුණු අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 3.58 ක් තරම් ඉති අඩු ප්‍රතිශතයක් විය. | මේ වන විට ඒ පිළිබඳව සමාලෝචනය කර අදාල වාර්තාවක් නැවත ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව **(NPD)** වෙත 2023 ජනවාරි 30 දින යවා ඇත. | ගිවිසුම පරිදි කටයුතු කළ යුතු බව. |
| ෆර්ගියුෂන් පාර නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, පරිසර උපදේශක සභාව, සභාධිපත්‍ය | ව්‍යාපෘතියට අදාළ ජලාපවහන සහ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ ගැටලුවක් හේතුවෙන් ෆර්ගියුසන් පාරේ පාරිසරික නිෂ්කාශන සහ ගොඩනැගිලි බලපත්‍රය ප්‍රමාද | ව්‍යාපෘති ආරම්භකිරීමට ප්‍රථම අදාල අවසරපත්‍ර ලබාගත හැකි සහ ව්‍යාපෘතිය සඳහා සුදුසුකම් සහිත ඉඩම් තෝරාගතයුතු බව. |

| | | |
|---|---|---|
| කළමනාකරණ අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනවලින් ලබාගත යුතු අවසරපත්‍ර, ව්‍යාපෘතිය ආරම්භ කර වසර 2ක් ගත වුවද ලබාදී නොතිබුණි. | වන අතර අනුමැතිය තවමත් ලැබීමට නියමිතය. | |

(ඇ) **නාගරික ව්‍යාපෘති පිලියෙල කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය** (UPPF)

| | | |
|---|---|---|
| ණය ගිවිසුම අනුව,සපයා තිබූ ණය මුදල රු.මි. 883.88කට සමාන ඇ.ඩො.මි. 4.65 ක් වූ අතර ව්‍යාපෘතිය 2019 මාර්තු 06 දින ආරම්භ කර 2022 මාර්තු 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 38 ක් නියෝජනය වන රු.මි. 425.6 කට සමාන ඇ.ඩො. මිලියන 2.16 ක් පමණක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. නමුත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2020 අගෝස්තු 18 දිනැති ලිපියේ උපදෙස් අනුව, එදින සිට මෙම ව්‍යාපෘතියේ සියලුම මෙහෙයුම් කටයුතු නවතා දැමීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට උපදේශන ආයතන 02 ක් විසින් ලබා දිය යුතු මූලික වාර්තා 38 න් 17 ක්ද අවසන් වාර්තා 38 න් 18 ක්ද ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද 2021 පෙබරවාරි 28 දිනට උපදේශන ආයතනයක් විසින් ලබා දිය යුතු මූලික වාර්තා 29 න් 05 ක්ද අවසන් වාර්තා 29 න් 28 ක්ද ලැබී නොතිබුණි. ව්‍යාපෘතිය නතර කරන විට ව්‍යාපෘතිය විසින් ලබා තිබූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 42 සහ සියයට 68 ක් විය. | ජාතික ක්‍රම සම්පාදන දෙපර්තමේන්තුවේ උපදෙස් මත ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයක් හරහා ලබා දෙනු ලබන තාක්ෂණික සහාය හරහා ව්‍යපෘති සැකසීමේ කාර්යය සම්පූර්ණ කිරීමට දැනටමත් කටයුතු සම්පාදනය කර ඇත. | ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් අරමුණු, ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| කෙසේ වුවද, 2022 අප්‍රේල් 27 දිනැති ආසියානු සංවර්ධන බැංකුවේ ලිපියට අනුව ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය 2024 මාර්තු | සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම හා ඒ අනුව එහි ප්‍රගතිය වාර්තා කර ඇත. | ව්‍යාපෘතිය යටතේ ඉතිරි කාර්යයන් හඳුනාගෙන, එම ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ සවිස්තරාත්මක |

| | | | |
|---|---|---|---|
| | 31 දක්වා දීර්ඝ කර තිබුණද, ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර, ඒ අනුව එහි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |
| **(ඉ)** | **අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)** | | |
| | අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර ණය ලබාදෙන ආයතනය විසින් එකඟ වූ රු.මි. 10,025 ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දක්වා රු.මි. 2,164 (සියයට 21) පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. | මේ වන විට භාණ්ඩාගාරය අරමුදල් සපයන්නා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අඩු මට්ටමින් දිගටම කරගෙන යාමට ව්‍යාපෘතිය ඇගයීමට ලක් කරමින් පවතී. | අමතර වියදමකින් තොරව වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුබව. |
| | ව්‍යාපෘතිය යටතේ දුම්රිය ප්ලාසා සංවර්ධනය යටතේ රු.මි. 98 ක වටිනාකමකට ඉදිකිරීම් නිම කල අනුරාධපුර දුම්රිය ස්ථානයේ ආපනශාලාව ඇතුලු උපාංග 2022 වර්ෂයේදී දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. කෙසේ වුවද අලුතින් ඉදිකර තිබුණු ආපනශාලාව 2023 මැයි 31 දක්වාම උපයෝජනය කර නොතිබුණි. | විසඳුමක් සෙවීමට සහ එහි තිරසාර බව සහතික කිරීම සඳහා නාගරික සංවර්ධනය සම්බන්ධ කර ගැනීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදී. | දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| | උතුරු හා දකුණු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රු.මිලියන 288 ක් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘති අතරමඟ නතර කිරීම නිසා දරණ ලද වියදම් නිශ්කාර්ය වී තිබුණි. | රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය සහ ණය සපයන ආයතනය ණය මුදල අත්හිටුවීම හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් ප්‍රකාරව කරගෙන යාමට නොහැකි විය. උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සඳහා අත්පත් කරගත් ඉඩම අනුරාධපුර මහ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනාගත සංවර්ධනය සඳහා භාවිතා කරනු ඇති අතර එබැවින් මෙම ඉඩම් අත්පත් කර ගැනීම අපතේ නොයනු ඇත. | ඉතිරි වැඩ කටයුතු නියමිත වේලාවට ඉටු කිරීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| එසේම, සුරපුර එළිමහන් රංග පීඨය හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ එළිමහන් රංග පීඨයේ ප්‍රතිසංස්කරණ කටයුතු සියයට 90ක් අවසන් කර තිබුණද ප්‍රධාන උපකරණ සහ භාණ්ඩ (විදුලි පහන්, ආසන) 2023 මැයි 31 දක්වාම සපයා නොතිබීම හේතුවෙන් එම සිනමාහල් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතිණි. එබැවින් ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු.මි. 285.76ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | AFD විසින් අරමුදල් සැපයීම තාවකාලිකව අත්හිටුවන ලද බැවින්, අවසාන වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය අරමුදල් නොතිබුණි. | ඉතිරි කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගත හැකි පරිදි නිමකල යුතු බව. |

## 3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ඡේදය ප්‍රකාරව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීමකින් තොරව එවකට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් සුහුරුපාය ගොඩනැගිල්ලේ 17 සහ 18 වන මහල්වල කාර්යාල ස්ථාපිත කිරීම සහ ලේඛනාගාරය සැකසීමේ කාර්යය සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රමය භාවිතයෙන් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණි. 2021 දෙසැම්බර් 27 දින ඒ යටතේ ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණද මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී රු.මි. 5.95 ක් පමණක් ගෙවා තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන | සාමාන්‍ය ක්‍රියාපටිපාටියෙන් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.අ.i වගන්තිය අනුව හදිසි අවශ්‍යතාවයක් සේ සලකා මෙම ඉදිකිරීම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුව ප්‍රතිපාදන සලසා ගෙන ප්‍රසම්පාදන කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 (අ) ඡේදයට පටහැනිව මෙම කාර්යය සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන තිබුණේ අදාල කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතුද අවසන් කළ පසුව බව නිරීක්ෂණය විය. | | |

**3.7 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති අංක **KX-4890** දරණ සුඛෝපභෝග ජීප් රථය 2022 අප්‍රේල් 21 දින එවකට සිටි රාජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා අනුයුක්ත කර තිබුණු නමුත් **2022** මැයි 09 දින ඔහු රාජ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉවත් වන විට වාහනය නැවත අමාත්‍යාංශයට භාරදීමට කටයුතු කර නොතිබුණි. | රථය විධිමත් පරිදි නැවත භාරදෙන ලෙස රාජ්‍ය අමාත්‍යවරයාව පෞද්ගලිකව අවස්ථා ගණනාවකදීම දැනුවත් කළ ද යහපත් ප්‍රතිචාරයක් නොලැබිණි. | අමාත්‍යාංශයට අයත් වාහනය ආපසු ලබාගැනීමට හෝ වර්තමාන අමාත්‍යාංශය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කල යුතු බව. |
| (ආ) | වතුනිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය සතුවූ වාහන 08 ක් හා නාගරික සංවර්ධන අංශය සතු වාහනයක් සෞම්‍ය මූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම , වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය සහ පැවති මැණික් හා ස්වර්ණාභරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබූ නමුත් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව එම වාහන සමාලෝචිත වර්ෂය අවසාන | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන 02ට වාහන 08 ක් ලබා දී ඇත. එම වාහනවල සේවා හා අලුත්වැඩියා වියදම් අමාත්‍යාංශය දරනු ලබන අතර එම වියදම් පසුව ප්‍රතිපූරණය කරයි.<br>නාගරික සංවර්ධන අංශය සතු වාහනය නැවත පවරා ගැනීමට හෝ පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අමාත්‍යාංශයට අවශ්‍ය වාහන ඇණිය තීරණය කර කාර්යක්ෂමව උපයෝජනයට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වන විටත් නැවත අමාත්‍යාංශය වෙත ලබා දී නොතිබුණි. | | |
| (ඇ) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය සතුව පැවති සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ලබා දී තිබූ වාහන 03 ක් ඌන උපයෝජිතව එම පරිශ්‍රයේ ගාල් කර තිබූ අතර මෙම වාහන අමාත්‍යාංශය වෙත භාරගෙන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. | එම වාහන 03 සම්බන්ධව ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශ ලබාගැනීම සඳහා වන කමිටුවක් 2023 මැයි 15 දින පත්කර ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත. | ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව. |
| (ඈ) | අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම නිසා තක්සේරුගත පිරිවැය රු. මි. 7 ක් වටිනා මෝටර් රථයක් වසර 1 ½ ක කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | අළුත්වැඩියාව කඩිනමින් සිදුකර වාහනය අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | භාවිතයට ගත හැකි ආර්ථික සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කල යුතු බව. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වතුනිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ පැවති රිය අනතුරු වලට භාජනය වු රු.මි. 4 ක අලාභ සිදුවී ඇති වාහනයක් සම්බන්ධයෙන් මු.රෙ.105 අනුව කටයුතු කර අලාභය අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | හදිසි අනතුරින් පසුව අලුත්වැඩියා කිරීමට වැය කරන ලද මුදල් රක්ෂණ ආවරණය මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමටත් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි මුදල් රිය අනතුරට වගකිවයුතු පාර්ශව මගින් අයකර ගැනීමටත් එසේ නොවන අවස්ථාවල කපා හැරීමටත් කටයුතු කර ඇත. | අලාභ සිදුවී ඇති වාහන සම්බන්ධයෙන් මු.රෙ.105 අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 දරන අයවැය චක්‍රලේඛයේ 18 ඡේදය පරිදි, අහෝසිවී ගිය රාජ්‍ය අමාත්‍යාංශ නමින් විවෘත කරන ලද බැංකු ගිණුම් විගණිත දිනය දක්වාම වසාදැමීමට කටයුතු කර නොතිබුණි. | කැබිනට් අමාත්‍යාංශය යටතේ උප කාර්යාල වල බැංකු ගිණුම් ලෙස පවත්වාගෙන යාමට මේ වනවිට අවශ්‍ය අනුමැතීන් සඳහා ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අංක **NPD/UD/2018/PP/11(Urban Hub)** හා 2019 ජූනි 25 දිනැති ලිපිය අනුව කටුබැද්ද වෙළෙඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 15 ක් එනම් රු. මිලියන 29.73 ක් මොරටුව මහ නගර සභාව විසින් දැරිය යුතු වුවද, නාගරික සංවර්ධන අංශය විසින් එම මුළු මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් මොරටුව මහ නගර සභාවෙන් අයකරගත යුතු ඒකී මුදල 2023 මාර්තු 31 දින දක්වාම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නගර සභාවේ දැනට පවතින මූල්‍ය තත්වය මත එම මුදල් ගෙවීම අපහසු බව දැනුම් දෙන ලදී. | සාකච්ඡා කර ගෙවීමට එකග වූ මුදල සුදුසු පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2030 වර්ෂය වන විට සියලු දෙනාටම ප්‍රමාණවත් ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී ලබාගෙන තිබූ ප්‍රගතිය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 8 කට වඩා පහළ මට්ටමක පැවතුණි. | නව ඉදිකිරීම් තාවකාලිකව නැවැත්වූ අතර අඩක් නිමකළ නිවාස වලට ප්‍රාග්ධන ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණවත් පරිදි ලබා නොදීම නිසා අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය. | සපුරාගත හැකි ඉලක්කයන් හඳුනාගත යුතු බව හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීම වන බව |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ඉඩම් වලට අදාල ඔප්පු ජාතික | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉඩම් වලට අදාල ඔප්පු ලබාගෙන |

| | | | |
|---|---|---|---|
| | පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණු අතර එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් නිවාසවල නිත්‍යානුකූල අයිතිය නිවාසලාභීන්ට ලැබී නොතිබුණි. තවද වන්දි මුදල් ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ගෙන් මීට වසර 20 කට පෙර ඉඩම් අත්පත්කර ගෙන නිවාස ඉදිකර තිබුණු නමුත් අදාළ ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගෙවා නොතිබුණි. | නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දීමට මෙතෙක් කටයුතු කර නොමැත. | නිවාසවල නිත්‍යානුකූල අයිතිය නිවාසලාභීන්ට ලබාදීමටත් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි මුදල් කඩිනමින් ගෙවීමටත් කටයුතු කළ යුතු බව. |
| (ආ) | අංක 05/2008 හා 05/2008 (1) දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අමාත්‍යාංශය සඳහා එක් පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තියක් පිළියෙල කළ යුතු බව. |